සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs
සාමන්ත තැන්නගේ Saamantha Tennege

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananda Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandra Eeriyagama
08 8331 2318

TAS
Anura Seneviratne
03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

කලාව සහ රස වින්දනය

විදෙස්ගත ශ්‍රී ලාංකේය ජනතාවට බොහොවින් සමීප කලා මාධ්‍ය වන නාට්‍ය හා සිනමා නිර්මාණයන්ට ජනතාව දක්වන ප්‍රතිචාර නිරීක්ෂණය කිරීමේදී සැබෑ කලා රස වින්දනය පිළිබඳ කිසියම් අවුල් සහගත තත්වයක් ඇති බව ඉතා පැහැදිළිව අවබෝධ වෙයි සාමාන්‍ය ජනතාව කෙසේ වෙතත් නොයෙකුත් කලා නිර්මාණ වලට දායක වෙමින් කලා ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන සමහර කලාකරුවන් කලා කාරියන් පවා කලා නිර්මාණ රස විඳීම පිළිබඳව දක්වන ප්‍රතිචාර විමතිය දනවන සුළු ය ඔවුන් කලාව හඳුනාගෙන ඇත්තේ කවරාකාරයෙන් ද යන ප්‍රශ්නය අයින් පැන නගියි

මේ අද්දැකීම සමීපව අපට දැනුණේ පසුගිය දා පුදර්ශණය කළ විශිෂ්ඨ නිර්මාණශීලී ඛවක් පෙන්නුම් කළ කලාත්මක සිනමා නිර්මාණයක් අවසානයේ දී ය මේ සිනමාපටය නර්ඛා මෙහි වෙසෙන කලාකරුවන් කීපදෙනකු එම සිනමා පටය පිළිබඳව දැක්වූ අදහස් කලාව පිළිබඳ කිසියම් අද්‍යයනයක් ඇතැයි අප සිතා සිටින ඔවුනගෙන් කිසි දිනෙක අපේක්ෂා නොකළ අන්දමේ ඒවා විය

රස වින්දනය උගත යුතු දෙයකි ඒ පිළිබඳව විවාදයක් ඇතැයි නොසිතමු පීඩිතාවබෝධය හා විෂය අධ්‍යයනය රස වින්දනය නමැති කාර්යය වඩා පහසු කරවයි අද අපට තිස්ස දෙවේලේ නර්ඛන්නට ලැබෙන ඛිලාරික නිර්මාණ වලින් ලබන සැළළ වින්දනයෙන් මෑත වී උසස් නිර්මාණ හඳුනා ගැනීමට උත්සාහ කළ යුතු යයි අපි සිතමු ඒ සඳහා බුද්ධිමය හැඩ ගැසීමක් අධ්‍යයනයක් අවශ්‍ය ය

පීඩිතයේදී අපට හමුවන මිනිසුන්ගේ පීඩිත මතුවිටින් අතහැර විට දක්නට ලැබෙන සැළළ චර්යා ගැන නොව ඔවුනගේ පීඩිතයේ සංකීර්ණ අභ්‍යන්තරය හඳුනා ගැනීමට ත් මිනිසුන්ගේ මානසික හා ආධ්‍යාත්මික සඛඳතා හා හැසිරීම් අධ්‍යයනය කරන්නටත් අප හුරුවිය යුතු ය

නර්ඛන්නත් ගේ රසඥතා වර්ධනය කිරීම කෙරෙහි වූ වගකීමෙන් කොටසක් නිර්මාණ කරුවා මත ද වැටෙයි. පවතින සමාජ යතාර්ථ ය හා එහි ප්‍රතිඵල තැන්හි විඳින මිනිස් කොට්ඨාශය ගැන යතාර්ථ ය හෙළිදරව් කරමින් ප්‍රේක්ෂකයා හට සත්‍යාවබෝධය ලබා දීම නිර්මාණකරුවාගේ යුතුකමයි සමාජය යතාර්ථය මැනැවින් නිරීක්ෂණය කර සෞන්දර්යාත්මක නිර්මාණ බිහි කිරීමට කලාකරුවා පැහැදිලි දෘෂ්ඨියක පිහිටා සිටිය යුතු ය මේ දෘෂ්ඨි ඌණතාව අද දවසේ අපේ නිර්මාණ වල පැහැදැලිව දැකිය හැකි ය හුදු සැළළ වින්දනය සඳහාම ප්‍රේක්ෂක සිත් හුරු පුරුදු කරවන නිර්මාණ බහුල වයයෙන් බිහිවන්නේ ද මේ නිසා ය

ප්‍රේක්ෂකයා රස වින්දනයට හුරු වන්නේ හොඳ නිර්මාණ නිබඳව ඇසුරු කරන්නට ලැබෙන විට ය ඒ සඳහා හොඳ නිර්මාණ බිහි විය යුතු ය අපේ රටේ නැත්නම් ඇති තැන් සොයා ගොස් අපේ අවශ්‍යතාව අපි සම්පූර්ණ කරගත යුතු ය

විමල් යනු කුමක් ද?

සාමන්ත තැන්නගේ - 2008/07

රෝහිත භාෂණ අබේවර්ධන

1994 මහ මැතිවරණ සමය ආසන්නයේ දී වාසුදේව නානායක්කාර, නව සමසමාජ පක්ෂයෙන් මිදී චන්ද්‍රිකා කුමාරතුංගගේ මැතිවරණ ව්‍යාපාරයට සහය දක්වමින් ලංකා සමසමාජ පක්ෂය හා එක්විය. වාසුගේ පෙරළිය හා එහි දේශපාලනය කෙරෙහි එල්ල කළ ප්‍රහාරාත්මක ලිපියක් එවකට 'හිරු' පුවත්පතේ පළවිණ. 'උදය කීර්ති පෙරේරා'නමින් ලිපිය ලියන ලද්දේ විමල් වීරවංශ විසිනි.

ලිපියේ මාතෘකාව මෙසේය - 'වාසු යනු කුමක් ද ? '

ඒ ලිපියට දැන් 14 අවුරුද්දකි. විමල් වීරවංශ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයෙන් බිඳී රාජපක්ෂ රජයට පක්ෂපාතී ස්ථාවරයක් මත දැන් අළුත් පක්ෂයක් ආරම්භ කොට තිබේ. නව පක්ෂයේ 'මංගල නියෝජිත සමුළුව හමුවේ' ඉදිරිපත් කරන ලද 'දේශපාලනික උපාය මාර්ගික වාර්තාවේ' මෙසේ දැක්වේ.

'වීරත්වය මුසු උදාර සටන් පාඨ වෙතින් උපදවන බල ශක්තිය තුළින් පමණක් සමාජ ජයග්‍රහණයන් නිර්මානය නොකෙරේ. බොහෝ විට, ජයග්‍රහණය කරා වන ගමන් මග වැටී ඇත්තේ වීරත්වය මුසු වාග් පාඨ මතින් පණ පෙවුණු විරෝධතා වෙතින් මෙන්ම, 'පාවාදීම්' වශයෙන් බැලූ බැල්මට යමෙකුට අවශ්‍ය නම් පහසුවෙන් නම් කළ හැකි, එහෙත් සැබෑ ලෙසම හරයෙන් එසේ නොවන සම්මුති ඇතැම් විට කෙටි අවාසි සහගත විය හැකි විභේදනකාරී එකඟතාවයන් හා සතුරා අන්දමන්ද කර වීමට සමත් සූක්ෂම උපක්‍රම යනාදිය වෙතිනි....ඇතැම් විට මතුපිටින් අසෝහන යැයි පෙනෙන පියවරක් වුව නිවැරදි වන්නේ, ඒ මගින් තම උපාය මාර්ගික දැක්මට අනුකූලව පොදුජන අරගලය අඟලකින් හෝ ඉදිරියට ගෙන යාමට හැකි වන්නේ ද යන ප්‍රශ්නයට ලැබෙන පිළිතුරට සාපේක්ෂවය.'

ඇතැම් විට, 1994 දී වාසුදේවගේ පෙරළියට වුව ද කදිමට ගළපාලිය හැකිව තිබූ මේ වාක්‍ය කිහිපයේ සාරය විසින් දැන් මතුකරන සරදම්කාරී ප්‍රශ්නය මෙබඳුය. 'විමල් යනු කුමක් ද?' අතීත දවස් වනාහි අනුපිළිවෙලින් පෙරළා බැලිය හැකි පොතක් වී නම්, ඒ ප්‍රශ්නය නොවැදගත් වන්නට ඉඩ තිබුණි. නමුත් දශක එක හමාරකට එපිටින් වූ අපේ අතීතය දැන් ශෝකී අවතාරයක් මෙනි. එය අපේ අදස නොගැටීමේ වේදනාවෙන් අප අවටම සැරිසරයි.

17 වසරකට පෙර මා දැන හඳුනාගත් විමල් විශාල ආත්මයක් තිබූ කුඩා මිනිසෙකි. සංහාර සමයකදී මාවත්, ලඳු ලැහැබ්, වන මූකලන්වල මරා

තම පක්ෂය තමන්ට කළ 'කෙණෙහිලිකම්' ගැන කතානායකවරයාට පැමිණිලි කරන්නට අප්‍රේල් 08 වෙනිදා පාර්ලිමේන්තුව තුළ නැගී සිටි විමල්, අනතුරුව එළඹි පැයේදී සිය ආපසු ගමන සම්පූර්ණ කළේය. උත්තර සමාජයක් පිළිබඳ වූ අචල විශ්වාසයෙන් සටන් කොට, වධ විඳ ජීවිත දුන් - සිරබත් කෑ පරම්පරා දෙකක ලක්ෂ සංඛ්‍යාත ගැහැණුන් සහ මිනිසුන්ගේ අනුපමේය පරිත්‍යාගයන්ගේ යශෝ කීර්තියේ මහිමයෙන් පාර්ලිමේන්තු සභා ගැබට ඇතුල් වූ මිනිසෙකු, 'උසස් පෙළ විභාගය අත් හරින්නට සිදුවීමේ හා සීගිරි නොයෑමේ පරිත්‍යාගයන්' පිළිබඳ උද්වේගයෙන් කතා කළේය. මහා දේශපාලකයෙකුට වසන් වූ ඔහුගේ අඟුටුමිටි ආත්මය, ගූඩ අඳුරින් පිරි ඒ සභා ගර්භය තුළ සැඟවෙන්නට තැනක් සොයන්නා සේ මට හැඟිණ.

13 වන පිටුවට